# සිංහල භාෂාවේ ආරම්භය හා ප්‍රාකෘත යුගයේ භාෂා ලක්ෂණ

කථිකාචාර්ය කනංගමුවේ රාහුල හිමි
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය - අනුරාධපුරය

---

සාමාන්‍ය දෘෂ්ටියට හසු නොවන්නා වූ කඩතුරාවන්ගෙන් වැසුණු ඉතිහාසයක් ගවේෂණය කිරීමෙන් ජාතියක් සතු භාෂාවක ආරම්භය කවදා කෙසේ සිදු වුණි දැයි නිශ්චිත ව ප්‍රකාශ කිරීම සුකර නො වේ. සිංහලයේ මුල් පදනම සොයන බොහෝ පඬිවරු විජය රජුගේ ජන්ම භූමිය සොයමින් සිංහල භාෂාව විජය රජුට ම සම්බන්ධ කිරීමට උත්සාහ ගත්හ. විජය රජුගේ ලංකාගමනය මෙරට සංස්කෘතියේ වැදගත් එක් සිදුවීමක් පමණක් මුත් එය සිංහල භාෂාවේ ආරම්භයට බලපෑ මූලිකතම හේතුව නො වේ. බොහෝ උගතුන්ගේ පිළි ගැනීම නම් සිංහල භාෂාවේ ආරම්භය තත් කාල පරිච්ඡේදයෙන් ඔබ්බට දිව යන්නක් බවයි.

ක්‍රි: පූ: 06 වැනි ශත වර්ෂයට අයත් ඓතිහාසික සිදුවීම් දෙස පරීක්ෂාකාරීවීමෙන් මෙරට විසූ ඇතැම් ගෝත්‍රික ජනතාවන් ගැන යම් අවබෝධයක් ලබා ගැනීමට පුළුවන. විජයාගමනයට පෙර පවා මෙරට ජනතාව හා නොයෙක් විදේශිකයන් නොයෙක් ආකාරයෙන් සම්බන්ධතා පවත්වා ඇත. එසේ ආර්ථික, දේශපාලනික වශයෙන් සම්බන්ධතා පැවැත්වීමෙන් ජාතියේ මෙන් ම භාෂාවේ ද සම්මිශ්‍රණයක් ඇති වන්නට ඇත. සිංහල භාෂාවේ ආරම්භය පිළිබඳ ව මැදඋයන්ගොඩ විමලකිත්ති හා කඩවැද්දුව සුමංගල යන හිමිවරු සිය "සිංහල භාෂාවේ ඉතිහාසය" නම් ග්‍රන්ථයෙන් මෙසේ විග්‍රහ කරති. "මෙසේ ඉන්දියාවෙන් හා තවත් රටවලින් පැමිණි අයත් සමඟ ලංකාවේ එකල විසූ යක්ෂ, රාක්ෂ, නාග, දේවාදී ගෝත්‍රිකයන් මුසු වුණු අතර ඔවුන්ගේ භාෂාවත් මුසු විය. එහෙත් ලංකාවේ ඉතා පැරණි ශිලා ලිපි අනුව නිගමනය කළ හැක්කේ උතුරු ඉන්දියානු ප්‍රාකෘතයන් සමඟ පැරණි සිංහලය වැඩි වශයෙන් ගැලපුණු බව ය."[1]

විජයාගමනයට පෙර ඈත රටවලින් පැමිණි ජනතාව වෙළඳ කටයුතු නිසා මෙරට ජනතාව හා සම්බන්ධතා පවත්වා ඇත. ඔවුනගේ භාෂාවත්, මෙරට ජනතාව භාවිත කළ භාෂාවත් අතර සම්මිශ්‍රණයක් ඇති වීම වැළැක් විය නොහැක්කකි. විජය රජුගේ පැමිණීමෙන් සිද්ධ වූයේ තව දුරටත් එම භාෂාව සම්මිශ්‍රණයවීමෙන් සංවර්ධනය වීමයි. නැත්නම් භාෂාත්මක

දක්වන කුරුණෑව ධම්මරතන හිමියන් ප්‍රාග් විජයීය හා විජයයමයානුගත කරුණුම හේතු කර දක්වයි.

"කිසිදු මාතෘ භාෂාවකට හෝ ප්‍රාකෘතියකට අනුගත නොවූ වදන් මාලාවක් අපගේ වචන කෝෂයෙහි ස්ථාවරව තිබීම සිංහල භාෂාවේ ආරම්භය දූරාතීතයකට යොමු කරවයි. මේ කරුණු පදනම් කර ගන්නා ඇතැම් භාෂා තත්ත්වඥයෝ සිංහල භාෂාව අන් කිසිදු භාෂාවකට සම්බන්ධ නොවූ මෙරටෙහිම නිපන් බසක් සේ සලකති. තවත් පිරිසක් ඉන්දියාවෙන් පැමිණි විජයාදීන්ගේ භාෂාවත් මෙරට මූල භාෂාවත් සම්මිශ්‍රණයවීමෙන් සිංහල භාෂාව නිපන් බවත්, කල්යාමේදී මූල භාෂාව යටපත් කොට ආගන්තුක භාෂාව ඉස්මතුව සිංහල භාෂාව පහළ වූ බවත් සලකති."[2]

විජය කුමරු මෙරට පැමිණියේ ඉන්දියාවේ නැගෙනහිර ප්‍රදේශයෙන් ය. ඇතැමෙක් විජයගේ පැමිණීම ඉන්දියාවේ බටහිර ප්‍රදේශයට සම්බන්ධ කරන්නට උත්සාහ කළ ද, නැගෙනහිර වෙරළාසන්නයේ පිහිටි තාම්‍රලිප්තියෙන් ලක්දිවට ගොඩ බැස ඇත. නමුත් විජය රජු පසු කළා යැයි ගැනෙන භාරුකච්චා හා සුප්පාරක තොටුපල බටහිර දිගට අයත් ය. නැගෙනහිර මෙන්ම බටහිර දෙදිග ම ප්‍රචලිත වූ භාෂාවක් විජය රජු භාවිත කරන්නට ඇතැයි ද භාෂාත්මක වශයෙන් ඒ දෙදිගයන්හී ම භාෂාවෙහි සාම්‍යයක් පවතින්නට ඇතැයි ද අනුමාන කළ හැකිය. විජයාගමනයෙන් පසුව වූ භද්දකච්චායනා කුමරියගේ ආගමනයත් ඇයගේ සොහොයුරන්ගේ ආගමනයත් නිසා ඉන්දියාවේ විවිධ ප්‍රාදේශීය වශයෙන් භාවිත කළ භාෂාව මෙරට ජනතාව අතර සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට ඇත. මුල් භාෂාව හා සම්මිශ්‍රණය වන්නට ඇත. තියඩෝර් පී. පෙරේරා මහතා "සිංහල භාෂාව" නම් ග්‍රන්ථයෙන් ඒ බව මෙසේ අනාවරණය කරයි.

"විජය රජු සහ ඔහුගේ පිරිස කථා කළ භාෂාව සමහර කරුණුවලින් ලංකාවේ මුල් පදිංචිකාරයන්ගේ භාෂාව හා සමාන ව තිබුණේ යයි ද, ඒ භාෂා දෙක මිශ්‍රවීමට වැඩි බාධාවක් නොතිබුණේ යැයි ද කල්පනා කළ හැකි ය."[3]

සිංහල භාෂාව ප්‍රභව වූයේ ආර්‍ය භාෂා ප්‍රකෘතයකින් ද නැතහොත් අනාර්‍ය භාෂා ප්‍රාකෘතයකින් ද, යන්න පිළිබඳව ගවේෂණය කළ වාග්වේදී හු නොයෙක් කරුණු ඉදිරිපත් කළහ. එම කරුණු අනුව පිළිගත හැකි වඩාත් සාධාරණ නිවැරදි තීරණය වූයේ සිංහලයේ ප්‍රභවය ආර්‍ය භාෂා මූලයකින් සිදු වූ බව යි. විශාල පිරිසක් සමඟ රාජ්‍යයක් පිහිටුවීමෙහි බල පුළුවන්කම ද ඇතිව පළමු කොට ලංකාව තරණය කළ "විජය" කුමරුගේ භාවිත භාෂාව ඒ සඳහා බෙහෙවින් උපකෘත වන්නට ඇතැ යි උපකල්පනය කිරීමට කිසිදු බාධාවක් නැත. නමුත් ප්‍රධාන බාධකය වන්නේ පිළි ගැනීමට හැකි කිසිදු ඓතිහාසික ලේඛනයක් අත්පත් වී නොතිබීමයි.



විජයාගමනයෙන් වර්ෂ 275 කට පමණ පසු එළඹි දෙවන පැතිස් යුගය මෙරට ඉතිහාසයේ විශාල පෙරළියක් සිදු වූ යුගයකි. එනම් ඉන්දීය ධර්මදූතයන් වහන්සේලා ගේ ලංකාගමනය යි. උන් වහන්සේලා හඳුන්වා දුන් දායාදයන් අතර අක්ෂර කලාව ද වැදගත් ය. ධර්මදූතයන් වහන්සේලා මෙරට ජනතාවට ගැලපෙන, තේරෙන භාෂාවකින් ධර්ම දේශනා කළහ. එම භාෂාව කුමක් ද? මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට භාවිත භාෂාව දැන ගෙන සිටියේ ද, නැතහොත් දෙපිරිසට ම ඔවුනොවුන් භාවිත කළ භාෂාව අවබෝධ කර ගැනීමට පුළුවන් වූයේ ද? යන ප්‍රශ්න මෙහි දී මතු වෙනු ඇත. විජය රජු ඇතුළු පිරිස භාවිත කළ ඉන්දීය ප්‍රාකෘතයකින් මෙරට මූල භාෂාව සංවර්ධනය වූ බැවින් ධර්ම දේශකයන්ගේ භාෂාව අවබෝධ කර ගැනීම මෙරට වාසීන්ට දුෂ්කර නොවන්නට ඇතැයි හැඟේ. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂ ප්‍රස්ථාවනාවේ පැණෙන පහත පාඨයෙන් ඒ බව තවදුරටත් අවබෝධ කර ගැනීමට පුළුවන.

"විජය රජු ඇවෑමෙන් අවුරුදු දෙසීය ගණනක් ගිය කල රජ පැමිණි දෙවන පැතිස් නිරිඳුන් සමයෙහි බුදු සසුන් පිහිටුවීම සඳහා මගධ දේශයෙන් මෙහි පැමිණි ධර්මදූතයන් වහන්සේලාට මෙරට වැසියන් හා පහසුවෙන් කතා බස් කර ගැනීමට හැකි වූ හෙයින් පුරාණ මාගධී ප්‍රාකෘතය ම හෝ ඊට ආසන්න වූ භාෂාවක් හෝ එකල මෙහි ව්‍යවහාර වූ බව සිතා ගත හැකි ය."[4]

දඹදිව භාවිත වූ අශෝක ප්‍රාකෘත භාෂාවට සමීප සම්බන්ධතා තිබූ භාෂාවක් ක්‍රි: පූ: 03 වැනි සියවස දී මෙරට ජනතාව අතර භාවිත වන්නට ඇත. විශේෂයෙන් ම අශෝක රජයේ දී ආගමික දූතයන් වශයෙන් මෙරට වැඩි ධර්මදූතයන් අතින් අශෝක රජයේ භාෂාව භාවිත වූවා ද, යනු සැක සහිත ය. මහාවංශයේ සඳහන් පරිදි මිහිඳු හිමියන් දම් දෙසා ඇත්තේ හෙළදිව් භාෂාවෙනි.

"ලංකාව පිහිටු වීමෙහි හෝ අධික කොට තැබීමෙහි ශාස්තෘ කෙනෙකුන්ගේ ආකාර ඇති ලක් දිවට පහණක් බඳු වූ ඒ මහා ස්ථවීර තෙමේ මෙසේ දෙතැනෙක් හි දී හෙළදිව් බසින් දහම් වදාරා ලක්දිව වැසි ජනයා කෙරෙහි සද්ධර්මයාගේ බැස ගැන්ම කර වූ සේක; හෙවත් සද්ධර්මයේ පිහිට වූ සේක."[5]

සිංහල අක්ෂර මාලාව බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් පැවැත එන බව දක්වන බොහෝ උගත්තු තත් බ්‍රාහ්මී අක්ෂර අශෝක ප්‍රාකෘතයන් ට දක්වන ඇඩි සාම්‍යතාව ද ගෙන හැර දක්වති. හේ කෙසේ වෙතත් ත්‍රිපිටකය වැනි ගැඹුරු දර්ශනයක් හෙළබසින් ලියා තබන්නටත් අටුවා සම්පාදනය කරන්නටත් පොහොනා සංවර්ධන භාෂාවක් මහින්ද යුගයේ දී මෙරට භාවිත වී ඇත. තත් යුගයේ සාහිත්‍යයේ සංවර්ධනය පිළිබඳව කොටහේනේ ප්‍රඥාකීර්ති හිමිගේ ප්‍රකාශයක් තෙරිපැහැ සෝමානන්ද හිමියන් සිය "සිංහලයේ පරිණාමය" ග්‍රන්ථයට

474



"ක්‍රි: පූ: 3, 2 වැනි ශත වර්ෂ වලට අයත් සෙල් ලිපි වලින් සිංහල අකුරු බ්‍රාහ්මී අක්ෂරවලින් පැවත එනැ යි සිතීමට පුළුවන් වෙයි. ලේඛන කලාව ගැන බෞද්ධ ධර්ම දූතයන් විසින් ලක් වැසියන් තුළ ප්‍රබෝධයක් ඇති කරන ලදැ යි එයින් හැඟේ. මෙසේ ධර්ම ප්‍රචාරය, ධර්ම සාකච්ඡා, අටුවා පරිවර්තන, ග්‍රන්ථ තැනීම ආදිය නිසා මිහිඳු යුගය සිංහල සාහිත්‍යයෙහි මහත් අභිවෘද්ධිය සැලසුණු අවස්ථාවක් බව එළි වෙයි. මිහිඳු මහ රහතන් වහන්සේගේ මෙහෙයීමෙන් පහළ වූ සිංහල පොත් පත් සියල්ලම ගොඩ ගැසූ කල මධ්‍යම ප්‍රමාණයේ ඇතුන් සත් දෙනෙකුගේ පිට තරමට උස් වේ යැයි පූර්වාචාර්යවරුන් කියන බව පැරණි පාලි පාඨයක සඳහන් වේ."[6]

මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ ධර්මය අවබෝධ කර ගන්නට ද, උන් වහන්සේ හා සාකච්ඡා පවත්වන්නට ද පොහොනා සංවර්ධනාත්මක භාෂාවක් ක්‍රි: පූ: 03 වැනි සියවස වන විට මෙරට ජනතාව අතර භාවිත වූ බව නොයෙක් ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය කර ගැනීමට පුළුවන. වංශ කතා තොරතුරු අනුව මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම් පියතිස්ස රජු හමු වූ විගස ම ඔහුගේ ප්‍රඥා මහිමය විමසීම පිණිස සංවාදයක යෙදුණු බව පෙනේ.

"මිහිඳු මහ හිමියන් ප්‍රධාන භික්ෂු පිරිස එද්දී මේ දිවයිනේ භාෂාවත් උන්වහන්සේලා කථා කළ භාෂාවත් අතර දැඩි සම්බන්ධයක් තිබුණු බව ද පෙනේ. ලක්වැසියන් සමඟ උන්වහන්සේලාටත්, උන්වහන්සේලා සමඟ ලක්වැසියන්ටත් ඔවුනොවුන්ගේ අදහස් ඔවුනොවුනට හැඟෙන පරිදි කතාබස් කරන්නට පුළුවන්කම තිබුණු හෙයිනි."[7]

සිංහල භාෂාවේ ආරම්භය පිළිබඳව කරුණු ගවේෂණය කිරීමේදී ඒ සඳහා ඉවහල් වූ ප්‍රබල සාධක කීපයක් කෙරෙහි අවධානය යොමු කරවිය යුතු බව ඉහත විස්තරයෙන් පෙනේ. එනම් ප්‍රාග් විජයීය භාෂාත්මක තොරතුරු, විජයානුගත භාෂාත්මක තොරතුරු හා මහින්ද සමයානුගත භාෂාත්මක තොරතුරු වශයෙනි. මෙසේ භාෂාවේ ප්‍රභවය දූරාතීතයකට යොමු කළ ද පිළි ගත හැකි අඛණ්ඩ ඓතිහාසික මෙන්ම පුරා විද්‍යාත්මක තොරතුරු හමුවන්නේ ක්‍රි: පූ: 03 වැනි සියවසින් මෙපිට ය. මේ සියලු තොරතුරු සැලකිල්ලට බඳුන් කරමින් අපට ගවේෂණය කරන්නට අත්පත් වී ඇති භාෂාවේ ආරම්භය පිළිබඳව කේ.ඩී.පී. වික්‍රමසිංහ මහතා "සිංහල හා රාජ්‍ය භාෂාව" නම් ග්‍රන්ථයේ මෙසේ නිගමනයක් ඉදිරිපත් කරයි.

"ලංකාවේ සිංහල භාෂාව හැඩ ගැසුණේ විජයාවතරණයට පෙර මෙහි පැවැති භාෂාවත්, විජය හා පිරිසගේ භාෂාවත්, මිහිඳු මාහිමියන් දහම් දෙසූ



හැකි ය. ඉන් පසු වරින් වර මෙ රටට සංක්‍රමණය වූ අනෙකුත් ජාතීන්ගෙන් ලබන ලද පෝෂණය නිසා මඳ කලකින් ම සිංහලය ඕනෑම අදහසක් පළ කළ හැකි ඉතා පළල් ශබ්ද කෝෂයකින් යුත් බල සම්පන්න භාෂාවක් බවට පත් විය."[8]

සිංහල භාෂාවේ ආරම්භය කෙසේ සිදු වූවද, පිළිගත හැකි ලිඛිත සාක්ෂි හමු වන්නේ ක්‍රි: පූ: 03 වැනි සියවසින් මෙපිට බව අපි ඉහත දී සඳහන් කෙළෙමු. එබැවින් භාෂාවේ පරිණාමය පිළිබඳ ගවේෂණය කළ දෙස් විදෙස් වාග්වේදී හු සාමාන්‍ය දෘෂ්ටියට හසු නොවන්නා වූ කඩතුරුවන්ගෙන් වැසී ගිය අප්‍රවත් වූ තත් භාෂාත්මක සංසිද්ධි පසෙක දා පරිණාමීය යුග බෙදීම් කළෝ ක්‍රි: පූ: 03 වැනි සියවසෙන් මෙපිට ය. එහි දී බහුතර සම්භාවනාවට පාත්‍ර වූයේ විල්හෙල්ම් ගෛගර් පඬිතුමාගේ යුග බෙදීම් පිළිවෙලට යි. "ශ්‍රී සුමංගල ශබ්ද කෝෂ" ප්‍රස්ථාවනාවේදී තත් ක්‍රම න්‍යාය සෝරත හිමියෝ මෙසේ උපුටා දැක් වූහ.[9]

1. සිංහල ප්‍රාකෘත අවධිය - ක්‍රිස්තු වර්ෂයෙන් යට 02 වැනි ශත වර්ෂයේ පටන් ක්‍රි: ව: 03 වැනි හෝ 04 වැනි ශත වර්ෂය දක්වා
2. පුරාතන සිංහල අවධිය - ක්‍රි: ව: 04 වැනි ශත වර්ෂයේ පටන් ක්‍රි: ව: 08 වැනි ශත වර්ෂය දක්වා
3. මධ්‍යතන සිංහල අවධිය - ක්‍රි: ව: 08 වැනි ශත වර්ෂයේ පටන් ක්‍රි: ව: 13 වැනි ශත වර්ෂයේ මැද භාගය දක්වා
4. නූතන සිංහල අවධිය - ක්‍රි: ව: 13 වැනි ශත වර්ෂයේ මැද භාගයේ පටන් අද දක්වා

ක්‍රි: ව: 1937 දී විල්හෙල්ම් ගෛගර් පඬිතුමා "රාජකීය ආසියාතික" සඟරාවට "සිංහලයේ වාග් විද්‍යාත්මක ලක්ෂණ" මැයෙන් ලියූ ලිපියෙහි තත් යුග බෙදීම තවදුරටත් සංශෝධනය කොට ඇත. "සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය" නම් ග්‍රන්ථයේ දී මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා එම යුග බෙදීම් න්‍යාය මෙසේ උපුටා දක්වයි.[10]

1. සිංහල ප්‍රාකෘත යුගය - ක්‍රි: පූ: 3/2 සියවස සිට ක්‍රි: ව: 4/5 සියවස දක්වා
2. පුරාතන සිංහල යුගය - ක්‍රි: ව: 4/5 සියවස සිට ක්‍රි: ව: 08 සියවස දක්වා

475



4. සම්භාව්‍ය සාහිත්‍ය යුගය - ක්‍රි: ව: 13 සියවස මැද සිට ක්‍රි: ව: 17 සියවස දක්වා

5. නූතන සිංහල යුගය - ක්‍රි: ව: 17 සියවස සිට අද දක්වා

"සිංහල සාහිත්‍යයේ නැගීම" තුළින් "මාර්ටින් වික්‍රමසිංහ" මහතා සිංහල භාෂාවේ පරිණාමීය යුග ශබ්ද කෝෂවලට අනුව ඉදිරිපත් කර ඇත්තේ මෙසේ ය."[11]

1. සිංහල ප්‍රාකෘත අවධිය - ලක්දිව ගුහා ලිපි හා සෙල් ලිපි භාෂාව
2. ප්‍රථම සිංහල අවධිය - ප්‍රාකෘත ස්වරූපයෙන් මධ්‍යතන යුගයේ සිංහලය තෙක් විකාශනය වුණු භාෂාව ප්‍රථම සිංහලය නම් වෙයි.
3. මධ්‍යම සිංහල අවධිය - අට වන සියවසෙහි පටන් දහ තුන් වැන්න තෙක් වැඩුණ බව ය.
4. නූතන සිංහල අවධිය - දහතුන් වැනි ශත වර්ෂයේ මැද පටන් වර්තමානය තෙක්

දෙස් විදෙස් උගතුන්ගේ බෙදීම් ක්‍රමයට ගොදුරු වූ සිංහල භාෂාවේ පරිණාමය පිළිබඳව නවතම අභිසංස්කරණ ක්‍රම න්‍යායක් එක් කළෝ මහාචාර්ය විමල් ජී. බලගල්ල ශූරී හු ය. "සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය" නම් ග්‍රන්ථයෙන් තත් ක්‍රම න්‍යාය ඉදිරිපත් කිරීමයි.[12]

1. සිංහල ප්‍රාකෘත යුගය - පූර්ව භාගය
   ක්‍රි: පූ: 3 සියවස - ක්‍රි: ව: 2/3 සියවස
2. සිංහල ප්‍රාකෘත යුගය - අපර භාගය
   ක්‍රි: ව: 2/3 සියවස - ක්‍රි: ව: 7/8 සියවස
3. මධ්‍ය සිංහල යුගය - පූර්ව භාගය
   ක්‍රි: ව: 7/8 සියවස - ක්‍රි: ව: 10/11 සියවස
4. මධ්‍ය සිංහල යුගය - අපර භාගය
   ක්‍රි: ව: 10/11 සියවස - ක්‍රි: ව: 17/18 සියවස
5. නූතන සිංහල යුගය - පූර්ව භාගය
   ක්‍රි: ව: 17/18 සියවස - ක්‍රි: ව: 19 සියවස මැද
6. නූතන සිංහල යුගය - අපර භාගය



කෙසේ නමුත් මෙම යුග බෙදීම අධ්‍යයනය සඳහා ඉතා පහසු ක්‍රමයක් වන නමුත් ඒ පිළිබඳ උගත් අවධානය තමා යොමු වී නැති බව පෙනේ.

මෙහිදී අපගේ අවධානය යොමු කරනු ලබන්නේ සිංහල ප්‍රාකෘත යුගයේ භාෂා ලක්‍ෂණයන් පිළිබඳය. ශත වර්ෂ 07 ක් වැනි දීර්ඝ කාල පරාසයක් පිළිබඳ ව අවධානය යොමු කළ යුතුවා මෙන් ම භාෂාත්මක වශයෙන් ද යොමු කළයුතු අවධානය සංකීර්ණ ය; විවිධය. භාෂාවක් ජනතාව අතර භාවිත වීමෙන් හා තත් ජනතාව තවත් ජන කොටස් සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන් භාෂාත්මක වශයෙන් සිදුවන්නේ ද එහි මුහුණුවර ක්‍රමයෙන් වෙනස් ස්වරූපවලට බඳුන් වීම යි. සිංහල භාෂාවෙහි විකාශය පිළිබඳ ව අවධානය යොමු කිරීමේදී අපට හමු වන්නේ ද, ඒ ඒ කාල පරාසයන් තුළ සිදු වූ භාෂාත්මක වෙනස්වීම් ය. පිළිගත හැකි ඓතිහාසික හා පුරා විද්‍යාත්මක සාධක ඒ සඳහා බෙහෙවින් ඉවහල් කර ගත හැකි ය.

සිංහල ප්‍රාකෘත යුගය වශයෙන් ගැනෙන්නේ ක්‍රි: පූ: 03 සිට ක්‍රි: ව: 04 වැනි ශත වර්ෂය තෙක් කාල පරාසය යි. මෙම යුගය සිංහල ප්‍රාකෘත යුගය වශයෙන් හැඳින්වෙන්නේ සමකාලීන ඉන්දීය ප්‍රාකෘතයන්ට සමාන ලක්‍ෂණ පෙන්නුම් කෙරෙන හෙයිනි. මෙම යුගයේ ලිඛිත සාක්‍ෂි ලෙස ලෙන් ලිපි හා පර්වත ලිපි කීපයක් ම පෙන්වා දීමට පුළුවන. මෙම මුල්ම ලිපි වල අක්‍ෂරයන්ගේ හැඩ ගැසීම හා සංවර්ධනය වූයේ දඹදිව තත්කාලීන ව ව්‍යවහාර වූ අක්‍ෂරයන්ගේ හැඩ ගැසීම හා සංවර්ධනයට සාපේක්‍ෂ ලෙසට යි.

"දැනට සොයා ගෙන තිබෙන ඉතා පැරැණි ශිලා ලිපි ක්‍රි: ව: යට 02 වැනි ශත වර්ෂයට අයත් බව නිශ්චය වශයෙන් කිය හැකියි.

ක්‍රි: ව: 02 වෙනි ශත වර්ෂය වනතුරු මුල් අවුරුදු 400 මුළුල්ලෙහි ලක්දිව ශිලා ලිපි ලියන ලද බ්‍රාහ්මී අක්‍ෂරයන්ගේ හැඩ ගැසීම වූයේ දඹදිව තත්කාලීන ලිපිවල අකුරු සංවර්ධනය වූ ක්‍රමයට ම ය."[13]

මේ නිසා ම ලිඛිත මුල් ම සිංහල ප්‍රාකෘතය යනුවෙන් හැඳින්වීමට උගත්තු මැළි නො වූහ. මෙම යුගයේ භාෂාවේ විශේෂ ලක්‍ෂණ කීපයක් දැක ගැනීමට පුළුවන. සරලව ඇරඹූ ලේඛනය ප්‍රාකෘත යුගයේ අවසාන භාගය පමණ වන විට (ක්‍රි: ව: 3/4 සියවස) දීර්ඝ විස්තර සහිතව ව්‍යාප්ත වූ බවක් තත්කාලීන ශිලා ලිපි ආශ්‍රයෙන් දැක ගැනීමට පුළුවන. එබැවින් අධ්‍යයනයේ පහසුව පිණිස තත් කාලයට අයත් ශිලා ලේඛන කීපයක් පළමුව මෙහි උපුටා දැක්වීම මැනැවැයි හැඟේ.

"දෙවන පිය මහ රජහ ගමණී උති"[14]

"දෙවන පිය මහ රඣහ ගමණී - තිසහ පුත දෙවන පිය.
තිස - අබයහ ලෙණෙ අගත අනාගත චතු දිස ශගශ දිනේ"[15]

(රිටිගල ලිපිය - ක්‍රි: පූ: 2/1)

"සිධම් දෙවාන පිය ති (ස-මහ) රජහ මරු - මකණ කතෙ
දෙවානපිය පුපීකණ ගමණී අභය මහරජ (හ පුතෙ දෙවා)
න පි ය නක මහ රජෙ විහිරබිජකහි මුපී ගුතික සහ
පරිවතක .......... විහරහි හිකු සගහ විසිති හමාණන (ය) යාකු
ච බතච වසවසික හාපීක (ච) ......... (න) කටු දිනෙ ........."[16]

"සි පුවිය මහසෙන - මහරජහ පුත සරිමෙකවණ අබමහ රජ චත ලෙගිතක ගිහි වනක - වස හි නකරති උතර - පසහි කළහුමනක තියමතනහී සිය පුවිය කිණියෙහි නිකත කඩු බල ගමකෙහි වසනක අමෙතිපහෙජ සිවයහ පුත දෙවයහ යහිස පවය - නව - වහෙරකෙහි දින අරිය වස වටවි දෙ හකඩ දස අමණක වී උදි ඉඩ බයලි දස අමණ ඉඩ ...... මෙවතක වෙඩවතක හෙණ වනය වනය අතොවසහි නිකමනියච ද අණ මස දොළොසපක දිවස අරියවස කරන මහ බිකු සඟහට නියත කොටු යහිස පවත තව වහරකහි දි නි."[17]

(තෝණිගල ලිපිය - ක්‍රි: ව: 4 සියවස)

මෙම යුගයට අයත් ශිලා ලේඛන බොහෝමයක් සොයා ගෙන ඇතත්, එයින් තෝරා ගත් කීපයක් පමණක් මෙහි ඇතුළත් කර ගන්නේ මෙම නිබන්ධයේ කෙටි වීම අපේක්ෂා වෙනි. සිංහල ප්‍රාකෘත යුගයට අයත් භාෂා ලක්ෂණ බොහෝමයක් මෙම ශිලා ලේඛනවලින් අවබෝධ කර ගැනීමට පුළුවන. අවබෝධයේ පහසුව පිණිස තත් ලක්ෂණ මෙසේ පිඬු කොට සඳහන් කිරීමට පුළුවන.

1. එළු බස නියෝජනය කෙරෙන අක්ෂර මාලාවක් භාවිත කිරීම. නමුත් ඇතැම් තැනෙක මාතෘ භාෂාවන් හී පැණෙන මහා ප්‍රාණාක්ෂර ද භාවිතයට ගෙන ඇත.

- මහරඣහ - සිධම් - භිකුසගහ -

2. සියලු වචන ස්වරාන්තයකින් අවසන් වීම්. එහෙත් ප්‍රාකෘත ඉන්දීය භාෂාවන් හී ස්වරාන්තයකින් මෙන් ම හලන්තයකින් ද වචන අවසන් කොට ඇත. මෙම කාරණද්වය පිළිබඳ ව මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා "සිංහල භාෂාවේ නව මුහුණුවර" ග්‍රන්ථයේ මෙසේ ප්‍රකාශ කරයි.

"ඉන්දියාවේ සිටි කාලයෙහිදී "සංඝයාට" යන අදහස දෙන්නට යොදන ලද්දේ "සංඝස්ස" යන පදය යි. එහෙත් ලක්දිවට ආ සිංහලයන්ගේ උච්චාරණයෙන් "ඝ" වැනි මහාප්‍රාණ ශබ්ද නැති වී ගියේ ය. මහාප්‍රාණ "ධ" යන්න සහිත "ධමම" යන පදය [illegible]



"ඛ" සහිත "රඣිත" යන පදය එවක ලිය වුණේ "රකිත" යනුවෙනි. "සංඝස්ස" යන පදයෙහි "ස්" යනුවෙන් අල් අකුරක් ද හමු වේ. එහෙත් පැරණිම ලෙන් ලිපිවල අල් අකුරු දක්නට නොලැබේ. එබැවින් "සංඝස්ස" යන්න සිංහලයෙහි "සගස" විය. "ධමම" යන නාමය "දම" විය. "උත්තිය" යන නාමය "උතිය" විය."......[18]

3. දීර්ඝ ස්වර නො යෙදීම.

ආගත > අගත
ශ්‍රාමණී > ගමණී
අනාගත > අනගත
නාග > නග
ස්තූප > තුබ

නමුත් ඇතැම් තැනෙක දීර්ඝ ස්වර යෙදී ඇත. හමාණන, යාඥව, හාටික වැනි වචන මහරත්මලේ පර්වත ලිපියෙහි නැගේ.

4. සංයුක්තාක්ෂර කේවල අක්ෂර බවට පත් වීම.

පුත්‍ර > පුතත > පුත
උත්පල > උප්පල > උපල
මධ්‍යම > මජිම
රක්ෂිත > රඣිත > රකිත
ධමම > දම

5. නිග්‍රහීතය භාවිත නොකිරීම.

සංඝ > සග
දෙවානංපිය > දෙවන පිය
අරිවංස > අරියවස
විංසති > විසති

6. සංස්කෘත 'ස' - 'ශ' - 'ෂ' යන ඌෂ්මාක්ෂර තුණම වෙනුවට මෙම යුගයේ භාවිත වූයේ 'ස' - 'ශ' යන්න පමණෙකි. නමුත් 'ස' වෙනුවට බොහෝ කොටම 'ශ' යොදා ගෙන ඇත. ශබ්ද කෝෂ කතුවරුන් පවසන්නේ ද මාගධී ප්‍රාකෘතයේ 'ශ' කාරය පමණක් යොදා ගත් බව යි.

චතුදිශ - ශගශ -
පුතශුතශ - මනපදශනෙ -

477



7. ස්වර මධ්‍යයෙහි වූ 'ප' යන්න 'ව' බවට පත් වීම.

වාපි > වවි
කහාපණ > කහවණ
උපනිකෙඛප > උවතිකෙවි

8. ව්‍යංජනයකට පූර්වයෙන් සිටි අනුස්වාරය හා අනුනාසිකය නොදැක්වීම.

පරිභුඤ්ජක > පරිභුජනක
සංඝ > සග
පටිසන්ථාර > පටිසතර

නමුත් අනුස්වාරය හා අනුනාසිකය උච්චාරණයේ පවතින්නට ඇතැ යි ශබ්ද කෝෂ කතුවරු ප්‍රකාශ කරති.[19]

9. කේවල 'ස' කාරය 'හ' කාරය බවට පත් වීම.

සකඩ > හකඩ
යසසනි > යහසිනි
පොසථ > පොහොත

10. අඝෝෂ ව්‍යංජන ඝෝෂ වීමත්, ඝෝෂ ව්‍යංජන අඝෝෂ වීමත් සිදු විණ.

| | |
|---|---|
| කාවරගාම > කජරගම | නගර > නකර |
| පාචීන > පජින | නාග > නක |
| ථූපාරාම > කුබරබ | යාගු > යාකු |
| භද්දථූප > බදුකුබ | භාණ්ඩාගාරික > බඩකරික |

11. ණ > න වීමත් න > ණ වීමත් ඉන්දීය ප්‍රාකෘතයන් තුළ මෙන්ම සිංහල ප්‍රකෘතයේ ද දක්නට ලැබේ.

රොහිණී > රොහිනි
ලයන > ලෙණ
අනීකස්ථ > අණිකට

12. විභක්ති කීපයකම ඉන්දීය ප්‍රාකෘතයට සමීප විබත් ප්‍රත්‍යය ගැනීම.

අශෝක ප්‍රාකෘතයේ පැණෙන - එ - ප්‍රත්‍යය සිංහල ප්‍රාකෘතයේ පෙර විභත් ප්‍රත්‍යයන් වශයෙන් යෙදී ඇත.

'ශුමනහ පුතෙ' - (ක්‍රි: පූ: 03 - වෙස්සගිරි ලිපිය)
'පරුමක තිශෙ' - (ක්‍රි: පූ: 01 - නාඋල්පොත)



- එ - විබත් ප්‍රත්‍යය පුල්ලිංග සඳහා පමණක් නොව නපුංශක ලිංග පෙර විබත් නාම පද, හැඳින්වීම පිණිස ද භාවිත කොට ඇත.

ලෙණෙ - දනෙ - තුබේ - ආදී නිදසුන්වලින් පෙනේ.

'ඉ' කාරය ද, 'අ' කාරය ද පෙර විබත් ප්‍රත්‍යය ලෙස ප්‍රාකෘත සිංහල යුගයේ දී භාවිතයට ගෙන ඇත.

'වහබ මහ රජි' (ක්‍රි: ව: 1 පෙරියකුලම්)
'තිස මහ රජ පුති' (ක්‍රි: ව: 2 පාලුමැකිච්චාව)
'අරිට මහගම' (ක්‍රි: පූ: 01 වේවැල්තැන්න)

- අභි - ප්‍රත්‍යය පෙර විබත් බහු වචනය සඳහා ප්‍රාකෘත සිංහලයේ යොදා ගත් බව 'සීගිරි ගී විවරණයේ' සෙනරත් පරණවිතාන මහතා අවධාරණය කරයි.[20]

කම් විබත වෙනුවෙන් එ - අ - ඉ ප්‍රත්‍ය ගත් බව සුමංගල ශබ්ද කෝෂ ප්‍රස්ථාවනාවේ සඳහන් වේ.

"කම් විභක්ති ඒක වචන ප්‍රත්‍යය (පා - අං වෙනුවට) අ. විය.
ඉකාරාන්ත ශබ්දයන් හී (පා - ඉං - වෙනුවට) ඉ විය."[21]

ලෙණං > ලෙණ
වාපිං > වවි
ලෙණං > ලෙණෙ

කතු විබත් සඳහා පුරුෂ ලිංගික ශබ්ද කෙරෙන් 'එන' ප්‍රත්‍යය ද ස්ත්‍රී ලිංග ශබ්ද කෙරෙන් 'ඉය' ප්‍රත්‍යය ද බහු වචන ප්‍රත්‍යය සඳහා 'එහි' ප්‍රත්‍යය ද යොදා ගත් බව කුරුණෑව ධම්මරතන හිමියෝ පෙන්වා දෙති.[22]

'දමරකිතෙන කරපිතෙ ශගශ' (ක්‍රි: පූ: 2 වැලියාය)

තිස්සාය > තිසය
සුමනාය > සුමනය

'එතෙහි කරිතෙ අරිට මහගම' (ක්‍රි: පූ: 01. වේවැල්තැන්න)

පාලියෙහි (අ) ස්ස යනුවෙන් ද ප්‍රාකෘතයෙහි 'ඍස' යනුවෙන් ද භාවිත වූ සපදන් විබත් ප්‍රත්‍යය සිංහල ප්‍රාකෘතයෙහි 'අස - අහ' යනුවෙන් ව්‍යවහාර කෙරිණ.[23]

සංඝස්ස සගස හෝ ශගශ

එසේම හට - අට - ට යන ප්‍රත්‍යය ද සපදන් විබත් අර්ථය දැනවීම පිණිස ප්‍රාකෘත යුගයේ භාවිතයේ තිබුණි. එය සංස්කෘත පාලි භාෂාවලින් බිඳී ආවකි.

අර්ථාය > අත්‍ථාය > අටය > හට > ට

'බිකු සගහටය දිනෙ' (ක්‍රි: ව: 01 විහාරේගල)
'විසිති හමානටය' (ක්‍රි: ව: මහරත්මලේ)
'බුකුසගහටය' (ක්‍රි: ව: 02 පාලුමැකිච්චාව)

සම්බන්ධාර්ථය වෙනුවෙන් ශ/ස/හ ප්‍රත්‍යය ඒකවචනයේ ද 'අන' ප්‍රත්‍යය බහුවචනයේ ද යෙදී ඇත.

'පරුමක නදික පුකශ පරුමක මිතශ ලෙණෙ' (ක්‍රි: පූ: 01 කුඩුම්බිගල)
'කලදර නගහ පුත දෙවහ ලෙණෙ' . (ක්‍රි: පූ: 03 වෙස්සගිරි)

ශ/ස ප්‍රත්‍යය පාලියේ ස්ස ප්‍රත්‍යයෙන් බිඳී එන්නට ඇතැයි තීරණය කිරීමට පුළුවන. 'ආනම්' ප්‍රත්‍යයෙන් අන' ප්‍රත්‍යය බිඳී එන්නට ඇත.

පුත්‍රානාම් > පුතන
ගෘහපතිකානම් > ගහපතිකා

එසේම ආධාර විබත් ප්‍රත්‍යය ලෙස මේ යුගයේ භාවිත වූයේ ශි/සි/හි/එ/එහි/ ප්‍රත්‍යයන් ය.

උපලගමසි
නගරසි
අතනෙහි
පනදගමහි

ප්‍රාකෘත සිංහල භාෂා යුගයෙහි භාවිත වූ ක්‍රියා පද කීපයක් ද දැක ගැනීමට පුළුවන. බහුල වශයෙන් යොදාගෙන ඇත්තේ අතීත කෘදන්ත හා පූර්ව ක්‍රියා ප්‍රත්‍ය බව පෙනේ. එහෙත් එම ක්‍රියා ප්‍රත්‍ය හමුවන්නේ ද සීමිත ප්‍රමාණයකිනි.

අතීත කෘදන්ත ක්‍රියා,

දත්ත > දින්න > දිනේ
නිර්යාත > නියාත > නියතෙ
ප්‍රතිෂ්ඨිත > පදිටිත
කාරාපිත > කරපිත
කෘති > කතෙට



පූර්ව ක්‍රියා රූප

'අය' 'ඉය' ප්‍රත්‍ය මඟින් පූර්ව ක්‍රියා රූප සකසා ගෙන ඇත.

කරය > (කැරැ)
කඩය > (කඩා)
කණවය > (කණවා)

ප්‍රාකෘත යුගයේ පශ්චාත් භාගය වන විට මුල් ක්‍රියා ප්‍රත්‍ය අපවත් වී ඇති බව බොහෝ උගතුන්ගේ පිළි ගැනීම යි. ඉන්දීය ප්‍රාකෘතයේ සිට පැමිණි ක්‍රියා පද අතරින් පතර හෝ හමු වෙන බව ඇතැම් පදවලින් පෙනේ.

ප්‍රා > චිරං තිට්ඨති, පා > චිරං තිට්ඨති, සිං.ප්‍රා > චිරචිටති.

මේ අයුරෙන් සිංහල ප්‍රාකෘත අවධිය පසුකාලීන අවධියනට වඩා සංකීර්ණ භාෂා ලක්‍ෂණ පෙන්නුම් කෙරෙන යුගයක් බව පෙනේ.

ඉන්දීය ප්‍රාකෘතයන්හි භාෂා ලක්‍ෂණ පදනම් කර ගෙන ආරම්භ වූ සිංහලය ක්‍රමයෙන් සිංහලට පමණක් ආවේණික ලක්‍ෂණවලින් පෝෂණය වීමට අඩිතාලම සැකසුණු යුගය වශයෙන් ප්‍රාකෘත යුගය හැඳින්වුව ද එහි වරදක් නැතැ යි හැඟේ. සරලව ඇරඹි ලිඛිත භාෂාවෙහි සංවර්ධනාත්මක අවස්ථාවන් ද මේ යුගය තුළදී ම දැකිය හැකි ය. අශෝක ප්‍රාකෘතයට ද ඉන්දියාවේ ඇතැම් ප්‍රාකෘත භාෂාවලට ද එමෙන් ම සිංහල ප්‍රාකෘතයට ම පමණක් ම උරුම වූ ලක්‍ෂණවලින් ද යුක්ත සංකීර්ණ භාෂා ලක්‍ෂණ ප්‍රකට කරන භාෂා යුගය වශයෙන් සිංහල ප්‍රාකෘත යුගය හැඳින්වීම යුක්ති යුක්ත ය. විශේෂයෙන් ම මේ යුගයේ නිපන් - තසම - තබව ශබ්ද රාශියක් ම හමු වෙන බව ද පෙනේ.

## පාදක සටහන්

01. සිංහල භාෂාවේ ඉතිහාසය - මැදඋයන්ගොඩ විමලකීර්ති, කඩවැද්දුව සුමංගල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ - 1965, පිට 04.

02. සිංහල සඟරාව - කුරණව ධම්මරතන, කැලණිය විශ්ව විද්‍යාලය - 1992 - 93, පිට 01.

03. සිංහල භාෂාව - තියඩෝර් ජී. පෙරේරා, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1932, පිට 07.

04. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

479



05. සිංහල මහාවංශය - ශ්‍රී සුමංගල, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, රත්නපොත් ප්‍රකාශකයෝ, කොළඹ, 1994, පරි. 14, පිට 64.

06. සිංහලයේ පරිණාමය - තෙර්පැහැ සෝමානන්ද, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1961, පිට 74.

07. සිංහල භාෂාවේ ඉතිහාසය - මැදඋයන්ගොඩ විමලකීර්ති, කඩවැද්දුව සුමංගල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965, පිට 07.

08. සිංහල හා රාජ්‍ය භාෂාව - කේ. ඩී. පී. වික්‍රමසිංහ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1956, පිට 41.

09. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

10. සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය - විමල් ජී. බලගල්ල, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1992 පිට 38.

11. සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ, සමන් ප්‍රකාශකයෝ - මහරගම, 1963, පිට 21.

12. සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය - විමල් ජී. බලගල්ල, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1992 පිට 50.

13. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

14. EPIGRAPHIA ZEYLANICA - Vol - V - p - 220

15. " " - Vol - I - p - 19

16. " " - Vol - I - p - 61, 62

17. " " - Vol - III - p - 177, 178

18. සිංහල භාෂාවේ නව මුහුණුවර - ජේ.බී. දිසානායක, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996, පිට 3, 4.

19. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

20. සීගිරි ගී විවරණය - සෙනරත් පරණවිතාන, ලංකාණ්ඩු මුද්‍රණාලය, 1962, පිට 156.

21. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

22. සිංහල සඟරාව - කුරුණෑව ධම්මරතන, කැලණිය විශ්ව විද්‍යාලය, 1992/93, පිට 19.

23. ශ්‍රී සුමංගල ශබ්දකෝෂ ප්‍රස්ථාවනාව - ප්‍රථම භාගය, ශ්‍රී ලංකා සංස්කෘතික



## ආශ්‍රේය ග්‍රන්ථ


01. සිංහලයේ පරිණාමය - තෙරිපැහැ සෝමානන්ද, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ - 1961

02. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය - ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය, 1937.

03. සිංහල භාෂාවේ ඉතිහාසය - මැදඋයන්ගොඩ විමලකීර්ති, කඩවැද්දුව සුමංගල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1965.

04. සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල, ලංකා විශ්ව විද්‍යාලය - කොළඹ, 1961.

05. සිංහල භාෂාව - තියඩෝර් ජී. පෙරේරා, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1932.

06. සිංහල හා රාජ්‍ය භාෂාව - කේ.ඩී.පී. වික්‍රමසිංහ, ගුණසේන හා සමාගම - කොළඹ, 1956.

07. සිංහල භාෂාවේ නව මුහුණුවර - ජේ.බී. දිසානායක, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996.

08. සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය - විමල් ජී. බලගල්ලේ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996.

09. සිංහල භාෂාවේ සම්භාවය හා පරිණාමය - විමල් ජී. බලගල්ලේ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1992.

10. සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ, සමන් ප්‍රකාශකයෝ - මහරගම, 1963.

11. සීගිරි ගී විවරණය - සෙනරත් පරණවිතාන, ලංකාණ්ඩු මුද්‍රණාලය, 1962.

12. සිංහල භාෂාවේ ව්‍යාකරණය - තිඹිරිවැව සුමනසාර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1996.

13. සිංහල මහාවංශය - ශ්‍රී සුමංගල, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 1994.

14. සිංහල ප්‍රාකෘතය - මොරටුවේ සාසනරතන, අතුල මුද්‍රණාලය - කොළඹ, 1956.


## ආශ්‍රිත සඟරා


01. සිංහල සඟරාව - කැලණිය විශ්ව විද්‍යාලය, 1992 / 93.

02. වාග්විද්‍යාත්මක ලිපි - සම්භාව්‍ය ප්‍රකාශන - කැලණිය. 1996.

03. නුවණ, 1 වෙළුම - 8 කලාපය, - අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, 1997 නොවැම්බර්.

04. සංස්කෘතික පුරාණය - 1 වෙළුම, 5 වන කලාපය, සංස්කෘතික ත්‍රිකෝණ ත්‍රෛමාසිකය, මධ්‍යම සංස්කෘතික අරමුදල,